*Vidyodaya J. Arts, Sci., Lett., Vol.* 8 *No.* 1 & 2 *pp.* 42-45 *January* 1980

# භර්තෘහරිගේ කාරක සම්බන්ධතා සංකල්පය පිළිබඳ විමසුමක්

**ආචාර්ය මහානාම කරුණාරත්න**
භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය

ක්‍රි. ව. 5–7 සියවස් අතර ජීවත් වූවකු ලෙස සැලකෙන භර්තෘහරි භාෂාවක බාහිර ආකෘතියට වඩා අභ්‍යන්තර ආකෘතිය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක් වූ වාග් විද්‍යාඥයෙකි. ඔහු ක්‍රි. පූ. 5 සියවසේ පාණිනීගෙන් ඇරඹී වැඩි දියුණු වී ගිය භාරතීය ව්‍යාකරණ සම්ප්‍රදය අනුගමනය කරමින් එය තවදුරටත් විකාශනය කළේය. භර්තෘහරීගේ උත්සාහය වූයේ පාණිනිගේ අෂ්ටාධ්‍යායීය මෙන් සංස්කෘතයට පමණක් සීමාවූ ව්‍යාකරණයක් සැකසීම නොව පොදුවේ භාෂාව කෙරෙහි බලපාන සිද්ධාන්ත පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක් කිරීමයි.

වාක්‍යයක අර්ථෝද්භාවනය සඳහා බාහිර (මතුපිට) වාක්‍ය ඛණ්ඩ විග්‍රහය පමණක් ප්‍රමාණවත්[1] නොවන බව ඔහු ඉදිරිපත් කළ මතය විය. සංකීර්ණ වාක්‍යවල අර්ථාවබෝධය සඳහා අර්ථ විචාරයේ මූලික අංගයක් වන **කාරක සම්බන්ධතා** පිළිබඳ සැලකිල්ලක් දැක්වීම අත්‍යවශ්‍ය බව ඔහු ප්‍රකාශ කළේය.[2]

භර්තෘහරි වාක්‍යපදීයෙහි ඉදිරිපත් කළ සංස්කෘත වාක්‍ය කිපයක් ඇසුරෙන් මේ පිළිබඳ විමර්ශනයක යෙදීම මෙහිලා අපගේ බලාපොරොත්තුවයි.

පහත දැක්වෙන වාක්‍ය 2 පළමුකොට අපගේ විමසිල්ලට ලක් කරමු.

1. දෙවදත්තඃ කාෂ්ඨෛඃ ස්ථාල්‍යාම් ඔදනම් පචති
   විකලිද්‍යතස්තණ්ඩුලාන් වික්ලෙදයති''.
   (දෙව්දත් දරින් සැලියෙහි බත පිසයි. මොළොක් වෙමින් පවතින සහල් ඇට මොළොක් කරවයි).

2. දෙවදත්තඃ අසිනා ලතාම් ජිනත්ති.
   (දෙව්දත් කඩුවෙන් වැල සිඳියි).

   භර්තෘහරිගේ සිද්ධාන්තයෙහි භාෂාවකට අයත් අභ්‍යන්තර සාධන හෙවත් කාරක 7 ක් දැක්වෙයි.

එනම්:

1. හෙතු
2. කර්තෘ
3. කර්ම
4. කරණ
5. සම්ප්‍රදන
6. අපාදන
7. ආධාර යනුවෙනි.

---

1. Nilsen, D. Lee. F. – Towards a Semantic Description of Deep Case. Mouton, The Hague, 1972. p.28
2. Pillai K. R. – Studes in the Vakyapadiya, 1971, p. 137 - 145.

එසේම සම්බන්ධය, සම්බොධනය යනුවෙන් බාහිර (මතුපිට) කාරක දෙකක් ද දක්වෙයි. ''කාරක සම්බන්ධතා'' යන මැය යටතේ විභක්ති හා කාරක හෙවත් සාධන අතර ඇති සම්බන්ධය, ඒ ඒ විභක්ති වලින් ප්‍රකාශ වන විවිධාර්ථ, හා කාරක සම්බන්ධතාවන්ගෙන් හෙලිවන ප්‍රධාන වාක්‍ය හා අන්තර් වාක්‍ය අතර ඇති අන්‍යොන්‍ය සම්බන්ධතාව ආදී කරුණු හර්තෘහරි සාකච්ඡාවට භාජනය කරයි.

fපිල්මෝර් ඇතුළු නූතන වාග් වේදීන් බොහෝ දෙනෙකු මෙම කරුණු පිළිබඳව සැලකිල්ලට දක්වන්නට පටන් ගෙන ඇත.[3] නූතන වාග්වේදීන් දරණ අදහසට සමාන බවක් පෙනෙන හර්තෘහරිගේ කාරක සිද්ධාන්තය පාණිනිගේ[4] කාරක සිද්ධාන්තය පදනම් කැර ගෙන දියුණු වූවකි.

වාක්‍යයට අයත්වන කාරක සංඛ්‍යාව එහි ආඛ්‍යාතය අනුව වෙනස් වෙයි. සරල වාක්‍යයක් අර්ථවත් වීමට යටත් පිරිසෙයින් එක් කාරක සම්බන්ධතාවක් ද උඩත් පිරිසෙයින් කාරක සම්බන්ධතා හතරක් ද තිබිය යුතුය. ඉහත දක්වූ පළමුවැනි වාක්‍යය කාරක සම්බන්ධතා හතරින්ම යුක්තය. (පචති පිසයි, යන ක්‍රියාවට අයත්වන අවම කාරක සංඛ්‍යාව දෙකකි. කර්තෘ හා කර්ම යනුවෙනි).

| | | |
|---|---|---|
| කර්තෘ: | දෙවදත්තඃ | ''දෙව්දත්'' |
| කර්ම: | ඔදනම් | ''බත්'' |
| කරණ: | කාෂ්ටෛඃ | ''දරින්'' |
| ආධාර: | ස්ථල්‍යාම් | ''තලියෙහි'' |

එම වාක්‍යයට අයත් අන්තර් වාක්‍යයෙහි එන ''වික්ලෙදයති'' ''මොළොක් කරයි'' යන ක්‍රියාවට කාරක දෙකක් සම්බන්ධ වෙයි.

| | | |
|---|---|---|
| කර්තෘ: | දෙවදත්තඃ | ''දෙව්දත්'' |
| කර්ම: | තණ්ඩුලාන් | ''සහල්'' |

මෙම පළමුවැනි වාක්‍යය පහත දක්වෙන පරිදි අන්තර් වාක්‍යය තුනකින් යුක්තය.

i. දෙවදත්තඃ කාෂ්ටෛඃ ස්ථාල්‍යාම් ඕදනම් පචති.
(දෙව්දත් දරින් සැලියෙහි බත පිසයි)

ii. තණ්ඩුලාඃ වික්ලිද්‍යන්තෙ.
(සහල් තෙමේම මොළොක් වෙයි)

iii. දෙවදත්තඃ තණ්ඩුලාන් වික්ලෙදයති).
(දෙව්දත් සහල් මොලොක් කරවයි)[5]

මෙම වාක්‍ය විග්‍රහයේදී හර්තෘහරිගේ අපේක්ෂාව වී ඇත්තේ පිසීමේ කාර්‍ය්‍යය සිදුකිරීමේදී එහිලා උපයෝගී වන කාරක සම්බන්ධතා හෙලිකොට දක්වීමයි. ඔහු කාරක සම්බන්ධතාවන්ට අයත් මූලික අර්ථ ලක්ෂණ දෙකක් දක්වයි. එනම් ඒවා ''පාලක'' ''පාලිත''

---

3. i. Filmore, C. J. Case for Case, 1968, ii. Nilsen, 1972
4. පාණිනි 1. 4 : 22 - 55
Kiparsky & Staal. Syntactic and Semantic Relations in Pāṇini, 1969 : 83 - 117
5. A = කර්තෘ I = කරණ = L = ආධාර O = කර්ම V = ක්‍රියාව CA ප්‍රයෝජක කර්තෘ

හෙවත් ''කර්තෘ'' ''කෘත'' යන අර්ථ ලක්ෂණ ලක්ෂණද්වයෙන් යුක්ත බවයි.[6] වෙනත් අයුරකින් කිවහොත් සියලු කාරක වලට තම තමන්ට අයත් කාර්‍ය්‍ය සම්බන්ධයෙන් ''කර්තෘ ශක්තිය'' ඇති අතර ප්‍රධාන කර්තෘගේ ක්‍රියාවට අනුව ඒවා ''ද්විතීයික'' හෙවත් ''පාලිත'' තත්ත්වයට පත්වෙයි.

1 වෙනි වාක්‍යයෙහි ප්‍රධාන කර්තෘ දෙවදත්තයි. පිසීමේ කාර්‍ය්‍යයේදී කාෂ්ට, ''දර'' ස්ථාලි ''තලිය'' හා ඕදන ''බත්'' ඔහු විසින් පාලනය කරනු ලැබේ. එහෙත් ප්‍රධාන කර්තෘ නැති තන්හි කරණ ආදි සෙසු කාරක වලට එම කාර්‍ය්‍යයෙහි කර්තෘ විය හැකිය.

නිදසුන්:

1. කාෂ්ටාඃ පචන්ති (දර පිසයි).
2. ස්ථාලි පචති (තලිය පිසයි).
3. ඕදනඃ (ස්වයමේව) පච්‍යතෙ (බත තෙමේම පිසෙයි)[7].

කාරක සම්බන්ධතාවන්ට අයත් ස්වතන්ත්‍ර ''පාලක'', අස්වතන්ත්‍ර ''පාලිත'' යන ලක්ෂණ වලට අමතරව ඒවා හේතු ඵල යන ලක්ෂණයන්ගෙන් ද යුක්ත වන බව භර්තෘහරි පැහැදිලි කරයි.[8]

මේ අනුව පළමුවෙනි වාක්‍යයෙහි අර්ථය ''දෙවදත් සහල් මොළොක් වීමට හේතු වීමෙන් දරින් තලියෙහි බත පිසීමට සලස්වයි (හේතු වෙයි), යනුවෙන් දැක්විය හැකිය. මෙහි ලා ඕදනම් ''බත'' යන්න හේතු රැසක ඵලයයි. එනම්:

1. දෙවදත් බත පිසීමට හේතු වෙයි.
2. දර බත පිසීමට හේතු වෙයි.
3. තලිය බත පිසීමට හේතු වෙයි.

එසේම ඵලය එනම් ඕදනම් ''බත'' ද සහල් තෙමේම මොළොක්ව බත් බවට පත් වන හෙයින් කර්තෘ ලක්ෂණයෙන් යුක්ත වේ. ඒ අනුව

4. බත තෙමේම පිසීමට සැලැස්වෙයි.[9]

මෙම කරුණු වලින් හෙළිවන තොරතුරු අනුව පළමුවැනි වාක්‍යයෙහි අර්ථය :-

''පිසීමෙහි කාර්‍ය්‍යයෙහි ලා කර්තෘ ආධාර හා කර්මයන් පාලනය කරණ දෙවදත් මොළොක වෙමින් පවත්නා සහල් මොළොක්වීමට සලස්වමින් දරෙහි (කරණ) උපකාර යෙන් හා තලියෙහි (ආධාර) ආධාරයෙන් බත් බවට පත්වීමට හේතු වෙයි. යනුවෙන්

---

6. Vākya Padīya : 111, Nilsen. 1972 : 8 - 9
7. Cf. Filmore, 1968 : 22
   John broke the window (Agent is the subject) a hammer broke the window (Instrument is the subject) John broke the window with the hammer (Agent is the subject not the Instrument)
8. VP iii, 90 - 100, 125 - 128, Taraporawala Sanskrit Syntax : 1967: 25-63
9. භින්නව්‍යාපාර රූපානාම් ව්‍යවහාරාදි දර්ශනෙ කර්තෘනාම් දර්ශනම් භින්නම සම්භූයාර් සාධකම්
   V P (11 : 377 PR 244)

   VP 111, 7: 54 - 56
   "It is important to note that Instruments bear the same relationship to the patient noun as do Agents" Nilsen, 1972 : 45

දක්විය හැකිය. ''.................... කරණය කර්මය කෙරෙහි ඇති සම්බන්ධයට සමාන වූ පරිද්දෙන්ම කර්මය කෙරෙහි සම්බන්ධතාවක් දක්වන ප්‍රයොජ්‍ය කාරකයක් (Causative case හඳුන්වා දීම මැනවියි සිතේ.''[10] යන නිල්සන්ගේ ප්‍රකාශයෙන් දක්වෙන පරිදි නූතන වාග්වේදීන් පවා මෙබඳු කාරක සම්බන්ධතා පිළිබඳ නිශ්චිත තීරණයකට එළඹ නැති නමුත් භර්තෘහරි මේ පිළිබඳ තීරණාත්මක විනිශ්චයක් දී ඇති බව පෙනේ. ඔහු විසූ අවධිය ගැන සලකන විට මෙබඳු අන්තර්ලීන කාරක සම්බන්ධතා පිළිබඳ ඔහුගේ අවබෝධය බෙහෙවින් අගය කළ යුත්තකි. මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් භර්තෘහරිගේ සාධන සමුද්දේශයෙහි දක්නට ලැබේ.

2. දෙවදත්තඃ අසිනා ලතාම් ඡිනත්ති ''දෙව්දත් කඩුවෙන් වැල සිඳී'' යන වැකියෙහි දෙව්දත් කරණය වන කඩුව පරිහරණය කිරීමේ කාය්‍ය්‍ර්‍යයෙහි ප්‍රධාන කර්තෘ වන අතර කඩුව කරණය වන තියුණු බව යොද ගැනීමේ කාය්‍ය්‍ර්‍යයෙහි ප්‍රධාන කර්තෘ වෙයි. තියුණු බව කැපීමේ කාය්‍ය්‍ර්‍යයෙහි ප්‍රධාන කර්තෘ වෙයි.

කැපීමේ කාය්‍ය්‍ර්‍යයෙහි තම තියුණු බව ප්‍රධාන කර්තෘ ලෙස මෙහෙය වීමට කඩුවත් දේවදත්තත් හේතු වෙයි. කැබලි වලට කපනු ලැබීමේ ශක්තිය තමා වෙත ඇති හෙයින් (ලතාම්) ''වැලද'' කැපීමේ කාය්‍ය්‍ර්‍යයෙහි කර්තෘ වේ. මේ අනුව දෙවැනි වැකියෙහි අර්ථය:–

''ප්‍රධාන කර්තෘ වන දෙව්දත් කැපීමේ කාය්‍ය්‍ර්‍යයෙහි දී උපකරණය වන කඩුව මෙහෙය වයි. කඩුව එහි තියුණු බව මෙහෙයවයි. තියුණු බව වැලට තමා කැබලි වලට කපනු ලැබීමේ කාය්‍ය්‍ර්‍යයෙහි කර්තෘ වීමට හේතු වේ.

කාරක සම්බන්ධතාවන්හි ස්වතන්ත්‍ර කර්තෘ හා හේතු කර්තෘ යන ලක්ෂණයන් දක්නා ලැබෙන හෙයින් අන්තර්ලීන කාරකයන්ගෙන් කවරෙක් වුවද වාක්‍යයක මතුපිට උක්තය විය හැකිය. සාමාන්‍යයෙන් පාලක හා හේතු යන ලක්ෂණ වලින් යුත් කර්තෘ කාරකයම වාක්‍යයක මතුපිට උක්තය වන නමුදු ප්‍රධාන කර්තෘ කෙනෙකු නැති තන්හි ''පාලිත'' හා ''ඵල'' යන ලක්ෂණවලින් යුත් සෙසු කාරකවලට ද වාක්‍යයක මතුපිට උක්තය විය හැකිය. මෙම කාරක සම්බන්ධයන්හි අනු පිළිවෙල[11] වක්තෘවිවක්ෂාව ''කියන්නාගේ කැමැත්ත'' අනුව සිදුවේ. ඕනෑම කාරකයක් කියන්නාගේ කැමැත්ත හා අවශ්‍යතාව පරිදි මතුපිට උක්තය විය හැකිය.

මේ අනුව නූතන වාග්විද්‍යාඥයින් ඉදිරිපත් කරන කාරක සම්බන්ධතා පිළිබඳ පුළුල් අවබෝධයක් භර්තෘහරි තුළ ද තිබිනැයි නිගමනය කළ හැකිය.

---

10. Nilsen, 1972 : 37

11. අයථාදීනාම් තු කර්තෘත්වෙ - තෛක්ෂ්ණ්‍යාදි කාරණම් විදුඃ
තෛක්ෂ්ණ්‍යාදීනාම් ස්වතන්ත්‍රත්වෙ දෙවධාතමා වර්තිෂ්‍යතෙ

12. ''If there is an A, it becomes the Subject, otherwise if there is an I it becomes the Subject. Otherwise, the Subject is O'' Fillmore, 1968 : 33
Nilsen, 1972 : 49